**මාලිම්බඩ ප්‍රාදේශිය සභාව**

**2026 වර්ෂය සඳහා සේවකයින් ලියාපදිංචි කිරීම.**

දෛනික වැටුප් ගෙවීමේ පදනම මත ලියාපදිංචි කර සේවයේ යොදවා ගැනීමට සේවකයින් බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සුදුසුකම් සපුරා ඇති මාලිම්බඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පදිංචි පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | බඳවා ගැනීමට අවශ්‍ය තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | ලියාපදිංචි කර ගැනීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම්,වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | පොදු සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු | 05 | සේවය කරනු ලබන දින වලට අදාලව සභාව මඟින් තීරණය කරනු ලබන වැටුප් ගෙවනු ලැබේ. | අටවන ශ්‍රේණිය ( 9 වසර සමත්ව තිබීම) | ❖ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.<br>❖ අයදුම්කරුව විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.<br>❖ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 3ක් මාලිම්බඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.පදිංචි වසමේ ග්‍රාම නිලධාරී මඟින් නිකුත් කරන ලද සහතිකය මත අදාල ප්‍රාදේශිය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.<br>❖ තනතුරට ලියාපදිංචි කර ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය. |

**වෙනත්**

01. **ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය 2026.10.20 දින වේ.**
02. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.
03. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.
04. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම ලියාපදිංචි කිරීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමා සතු වේ.
05. **මෙය සේවා අවශ්‍යතාවය මත සිදුකරනු ලබන සේවයේ යොදවා ගැනීමක් මිස ස්ථිර තනතුරක් සඳහා බඳවා ගැනීමක් නොවන අතර මෙය ස්ථිර පත්වීමක් සඳහා සුදුසුකමක් නොවේ.**

**සේවා ලබා ගැනීමේ ක්‍රමය**

1. සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ.
2. නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**සේවා නියුක්ත කිරීමේ කොන්දේසි.**

01. මෙය 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 19 (1) (i) විධි විධානයන්ට අදාළව, බාහිර සැපයුම්කරුවෙකු / පාර්ශවකරුවෙකු මඟින් සේවාවක් ලබා ගැනීමකි.

**ඉල්ලුම්කරන ආකාරය**

අයදුම්කරුවන් මෙහි දක්වා ඇත්තේ ආදර්ශ අයදුම්පත් අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත් **2026 ඔක්තෝම්බර් 20 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "සභාපති" , මාලිම්බඩ ප්‍රාදේශිය සභාව ,මාලිම්බඩ, පාලටුව යන ලිපිනයට** ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර , නියමිත දිනය පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමඟ පහත සඳහන් සහතික වල පිටපත් ඇමිනිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

01.උප්පැන්න සහතිකය
02.අධ්‍යාපන සහතික
03.පදිංචිය සහතික කිරීම පිණිස මෑතකදී ලබා ගත් ග්‍රාම නිලධාරී සහතිකය
04.මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්
05.පළපුරුද්ද පිළිබඳ සහතිකය